20 ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

නිශාන්ති රාමනායක - කොළඹ අධිකරණ

ලක්බිම

විධිවත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත අගියෝගයට ලක් කරමින් පැපරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා හා මහජන එක්සත් පෙරමුණේ මහලේකම් තිස්ස ගාමිණී අතිසිංහ මහතා ඊයේ (28) ශ්‍රේෂ්ඨාධිකරණයට විශේෂ පෙත්සමක් ගොනු කළේය.

ව්‍යවස්ථා සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවට ඇති අයිතිය තමුන් පිළිගන්නා නමුත් රටේ ජනතාවගේ ඡන්දය ප්‍රකාශිත කිරීමේ අයිතියට සංජුවම බලපාන එවැනි පනත් කෙටුම්පතක් ජනමත විචාරණයකින් පමණක් සම්මත කළයුතු බවට අර්ථකථනයක් නිකුත් කරනා ලෙසත් පෙත්සම්කරුවන් එමඟින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා තිබුණි.

එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත වුවහොත් රජයට අවශ්‍ය නම් පළාත් සභා ඡන්දය 2019 ඔක්තෝබර් දක්වා හෝ කල් තැබීමට අවශ්‍ය නීතිමය බලතල රජයට ඉඩකඩ විවර වන බවත් පෙන්වා දී තිබූ පෙත්සම්කරු එමඟින් රටේ ජනතාව සතු සර්වජන අයිතියට හානියක් සිදුවිය හැකි බවත් පෙන්වා දී තිබුණි.

නීතිඥ ශාන්ත ජයවර්ධන මහතා මඟින් ගොනු කර තිබූ එම පෙත්සමේ වගඋත්තරකරු ලෙස නීතිපතිවරයා නම් කොට තිබුණි.